# පහළ වෙලයි ගංවතුරයි




## සනත් පියසේන

ගං වතුර ගැඹීම අපේ ගමට ඉතාමත් හුරුපුරුදු සාමාන්‍ය දෙයකි. ගංවතුර ගලන වකවානුව තුළ මගේ හිතට නදීන් දැනුණු එක්තරා කරුණෙක් නම්, ගංවතුර ගැඹීමට පැය ගණනකට හෝ දවසකට කලින් ගවයින්ගේ කෑගැසීමේ විශේෂිත වූ ගොරෝසු හඬයි. බොහෝ ගවයින් හෙට ගංවතුර ගලන බව අද කියනවා වැනි ය. ගවයාගේ එම ගොරෝසු හඬත්, ගංවතුරත් අතර කිසියම් සම්බන්ධයක් අතතැයි මට සිතේ. ගොඩමග, වෙලේ, තොටුපළ පැත්තේ හැම ගෙදරක ම පාහේ ඔරුවක් ඇත. ගංවතුර නැති කාලයට බිත්තිය අයිනේ මුනින් අතට හැරී නිදාගන්නා ඔරුව, ගංවතුර කාලයට හිසි අතට හැරී නිවැසියන් එහා මෙහා ගෙන යයි.

මහවෙල පැත්තේ ගෙවල් කීපයක් ම සාදා ඇත්තේ බොහෝ උසට අත්තිවාරම් දමා ඒ මතය. ස්ථිරව සාදා ඇති සෑම ගෙයකට ම ශක්තිමත් අටුවක් ඇත. විශේෂයෙන් මෙම අටුව සාදා ඇත්තේ ගෙය යට වෙන තරමට ගංවතුර ගැඹුවිට අටුවට ගොඩ වී හිඳීම සඳහා ය. අටුව උඩ බතල සහ කොඩොල් ගොඩගසා ඇත. වැහි කාලයට සහ ගං වතුර කාලයට ප්‍රයෝජන ගැනීම සඳහා එසේ රැස්කර තබා ගනිති. සමහරුන් අටුවල කොඩොල් පැළවී වැල්ඇඳී අටුව පුරා විසිරී ඇතිවා මෙන් ම, සමහර විටක වහලට උඩින් වැල්ගිය අවස්ථා ද ඇත. අමු සහ මෙනේරි ද මේ හා සමාන ව රැස්කර තබා ගත් ධාන්‍ය වර්ග වේ. පිපිආච්චිලා, බේබිආච්චිලා, පීතර්මාමලා, ගුණතිලකමාමලා යනාදී බොහෝ දෙනෙක් ගංවතුර කාලයට පාරට එන්නේ ඔරුවෙන් ය. අක්කරඅරේ බිම්ම ප්‍රසිද්ධ බිම්මකි. බිම්ම යනු උතුරා යන ගඟේ ඉවුරට පිටින් ගලා එන විශාල ජල කඳයි. බිම්මට හසුවන ඕනෑම දෙයක් ඉතා වේගයෙන් ගසාගෙන යයි. සමහර විටක හරකුන් පවා බිම්ම පාරට ගසාගෙන ගොස් ඇති බව වැඩිහිටි අය කියනු අප අසා ඇත. වෙලේ සිට ඔරු පැදගෙන එන අයට බිම්ම ගැන විශාල අවබෝධයක් තිබේ. බිම්ම මගහැර හෝ බිම්ම කපා ගෙන හෝ ඔරුව හැසිරවීමට ඒ අය ඉතා දක්ෂ ය.

ගංවතුරට යටවන ගේදොර හිමි අය වතුර ගලා එන විට ම එයට මුහුණදීමට සහ බඩුමුට්ටු, ගෙවල්දොරවල් බේරා ගැනීමට නොයෙකුත් උපක්‍රම යොදති. ගංවතුර ගලාගෙන එනකොට ම වාගේ වතුරට ගසාගෙන යාහැකි යැ යි සිතෙන ඇඳ, පුටු, මේස, අල්මාරි ආදිය මෙන් ම ගෝනිවලට දමන ලද පිඟන්බඩු, වළං, හට්ටි, ආදී සියලු ම බඩුමුට්ටු ගස්වල ගැටගසනු ලැබේ. සමහර විටක ශක්තිමත් ව සාදා ඇති ගෙවල්වල කණුවල, ජනෙල්වල ආදියෙහි බැඳ දමනු ලැබේ. එසේ ම අටුවට නැතහොත් සොල්දරයට දැමිය හැකි සියලු ම භාණ්ඩ ඒවාට ගොඩ කරනු ලැබේ. ගංවතුර ගලාගෙන එන විට සියලු ම ජනෙල් දොරවල් ඇර දමති. ඉන් අදහස් කරනුයේ ගලායන ජලකඳට නිදහසේ ගලායාමට දිය හැකි සෑම ඉඩක් ම සැලසීම ය.

මැටිවලින් බැඳ ඇති වරච්චි බිත්තිවලට මුක්කු ගැසීම ද කරනු ලැබේ. සමහරවිට ගංවතුර බැස ගියාට පසු දකින්නට හැකි වන්නේ මුක්කුවලට හිර වී බිත්ති නො පෙරළුණත් සියලු ම මැටි දිය වී ගොස් ඉතිරි වී ඇති බට සැකිල්ල පමණි.
ගේ තුළට වතුර දැමූ පසු උයාපිහා ගන්නේ මේස මත ය. මේසය මතට යකඩ තහඩුවක් දමා ඒ මත ළිප බැඳ ඉව්මිපිගිමි කටයුතු කරගනු ලැබේ. මේසය ගසාගෙන යාම වළකනු පිණිස බරක් තැබීම ද සිදු කෙරේ. බැඳ ඇති බල්ලන්, හරකුන් වැනි සතුන් ගොඩ මණ්ඩියට ගෙන එන අතර එසේ කිරීමට අපහසු වුවහොත් උන් රැහැනින් මුදවා දමනු ලැබේ. රැහැනින් මිදුණු ගවයා ගංවතුරේ පීනා ගොස් ඉහළ ස්ථානයක සිට පණ බේරා ගෙන ගංවතුර බැස ගියාට පසු නැවත තම තමාට නිරතුරුව සෙවණ සැදන ගෙවතුවලට පැමිණේ.

පහළවෙලේ ශක්තිමත් ව සෑදූ, අදත් දැකගත හැකි නිවසකි අබරන් ආතා සහ පිපි ආච්චි අතුළු දරු පිරිස ජීවත් වූ නිවස. එම නිවස ගඟට මුහුණලා සාදා ඇත. එවකට ගංගාව ප්‍රධාන ගමනාගමන සහ ප්‍රවාහන මාර්ගය වූ බැවින් ගංගා අද්දර ගඟට මුහුණලා සඳු පැරණි ගෙවල් අද ද දැක ගැනීමට තිබේ. අබරන් ආතාගේ නිවස පොළොව මට්ටමින් අඩි කීපයක් ඉහළට අත්තිවාරම බැඳ ඇති අතර ගෙය ගොඩ නඟා ඇත්තේ ඒ මත ය. කබොක් ගලින් බැඳ කපළාරුකර ඇත. වහලට සිංහල උළු සෙවිලිකර ඇති අතර මිදුලේ පහන්පැලක් ද ඇත. මෙම මල් පහන් පුදන කුටිය අඩි හයක් පමණ උස කොන්ක්‍රිට් කණු පහක් මත කොන්ක්‍රිට්වලින් ම තනා ඇත. කිනම් වේගවත් ගංවතුරක් පැමිණියත් එයට අලාභයක් සිදු නොවේ.

ගංවතුර ගැලූ දිනවලට නිවසේ සියලු ම දෙනා ගොඩ මණ්ඩියට පිටත්කර හරින අබරන් ආතා ඇඳක් සහ පුටුවක් වහලේ එල්ලා ගනියි. ගංවතුර බසින තුරු අවශ්‍ය පරිදි හිඳීමටත්, දුක සැප සොයා හෝ ආහාරපාන රැගෙන ඔරුවලින් ඔහු කරා එන අය සමග සතුටු සාමීචියේ යෙදීමටත්, මෙම පුටුව සහ ඇඳ ප්‍රයෝජනයට ගනු ලබයි. ගංවතුර ගලන ප්‍රමාණය අනුව ක්‍රමයෙන් ඉහළට ඔසවා ගන්නා මෙම උපකරණ ගංවතුර බහින ප්‍රමාණය අනුව එල්ලා ඇති ලණුව බුරුල් කිරීමෙන් පහළට ද ගනු ලබයි. ඒ සමගම ඔරුව ද ඔහු අසල තබා ගන්නේ අවශ්‍යතාවයකදී එහෙට මෙහෙට යාමටත් කම්මැලි හිතුණු විට ගොඩ මණ්ඩියට ගොස් ඒමටත් ය. ලාම්පුතෙල් කුප්පිය වහලේ එල්ලෙයි. ගිතිපෙට්ටිය, විදුලිපන්දම, බුලත් මඩිස්සලය සහ භූමිතෙල් බෝතලය නැතිවම බැරි වස්තූන් ය. මහා රාත්‍රියේ පිම්මේ ශබ්ද නගා ගසාගෙන යන වතුරට මැදි වී වහලයේ එල්ලෙන ඇඳ මත නිදා ගැනීම හෝ හාන්සි පුටුවේ දිගැදි සිටීම අඹරන් ආතාට විනෝදයක් මෙන් ම ගේ දොර සොර සතුරන්ගෙන් බේරා ගැනීමට පිටුවහලක් වන්නට ද ඇත.

හැම ගංවතුරකට ම යටවෙන, කැඩී යන ගෙවල් කීපයක් මට මතකය. ඉන් මගේ මතකයේ ප්‍රමුඛව රැඳී ඇත්තේ එම් පොඩිඅම්මා සහ සුද්දබාප්පා ජීවත් වූ නිවස යි. සෑම ලොකු ගංවතුරක් අවසානයේ ම ඒ ගෙය අමුතුවෙන් සෑදීම ද සාමාන්‍ය දෙයකි. එම ගෙය පිහිටා තිබුණේ වෙරළු ගස් තොටුපළට කිලෝ මීටරයක් පමණ පහළින් ගඟ අයිනේ ම ය.

එම නිවසේ සිටින විට ගඟේ ඉහළ පළාත්වල සිට මොරටුවට ලී පහුරු, උණ පහුරු පැදගෙන යන දර්ශනය බොහෝ විට අපි දැක ඇත්තෙමු. උණ ගස් බොහෝ ප්‍රමාණයක් මිටිමිටි තබා එකට බැඳ අඩි දහයක් පහළොහක් තරම පළලට මෙන් ම, බොහෝ දිගට ද පහුර බැඳ තිබේ. සමහර විට පහුරු දෙක තුන එකට ඇඳා ඇත. සෑම පහුරකම පුංචි පැලක් සාදා ඇත. මා දැක ඇති සෑම පහුරු පැළකින් ම දුම් මතු වෙමින් තිබිණි. එම පැල පහුරේ එන පිරිස උයා පිහා ගන්නා ස්ථානය යයි අසා ඇත්තෙමි.

එක දවසක් පහුරක් යන විට සුද්දබාප්පා හූ කියා අත්පුඩි ගසා කතා කොට "ඔන්නං වරෙල්ලා රා පොල් කට්ටක් බිල යන්න" යයි පහුරේ යන අයට කතා කළේ ය.

ඉතා වේගයෙන් පහළට ඇදෙමින් තිබූ පහුර බොහෝ අමාරුවෙන් වේගය අඩුකර ගන්නවා මා බලා ගෙන ය. වේගය අඩු කොට ගත් පහුර ක්‍රමයෙන් ගඟේ මෙ

**නිර්මාණකරුවකුගේ මතක සටහන්**

*මේ කලබගෑනිය අස්සේ සුද්දබාප්පා සල්ලි එකතු කර ගන්නට පොරේ ය. එකිනෙකා සල්ලි ඇද දෙන විට ඔහුගේ අත් දෙක වෙවුලයි.*

ගොඩ ඉවුරට සේන්දු වී ඉවුර දිගේ අප සිටින හරියට ගෙනැවිත් ගසක ගැට ගසා එකා දෙන්නා, එම්පොඩිඅම්මලා වතුර ගන්නා තොටුපළින් ගොඩ වූහ.

එතැන අට දෙනෙකු පමණ සිටියා මට මතක ය. ඔවුහු පැමිණ සුද්දබාප්පලාගේ මිදුලේ තැනින් තැන ඉඩ ඇති ඇති හැටියට අඟුවේ, ගල් උඩ, කොටන් උඩ වාඩි වූහ. සුද්දබාප්පා විශාල රා කළගෙඩියක් අමාරුවෙන් ඔසවා ගෙනැවිත් මිදුලෙන් තබා ලොකු විදුරුවකට වත් කොට එකිනෙකාට බෙදුවේ ය. නො ඉවසිලි සිතින් පසුවුණු පිරිස පිළිවෙලට රා විදුරුව බැගින් මහා පෙරේත කමින් ගිල දැමුවෝය. තම්බාපු මසද්සොක්කා හැළියක් දුම් දමමින් ම මිදුලට පැමිණියේ එම්පොඩිඅම්මාගේ දෝතින් ය. අසල තිබුණු කැන්දා ගසකින් කැන්ද කොළ කඩාගෙන සියලු ම දෙනා මසද්සොක්කා කමට පටන් ගත්හ. වේලපු ගගේ මාළු හොද්දක් සමග රා බොමින් මසද්සොක්කා කමින් පිරිස බොහෝ ප්‍රීතියෙන් පිනා යමින් හැසිරුණහ.

"කොලුවො බොටත් ඔන්නං මයියොක්කා කෑල්ලක් කාපන්." යයි පැවසූ සුද්දබාප්පා රා විදුරු බාගයක් වත්කරගෙන තමාගේ කටේ හලා ගත්තේ ය. රා මත ක්‍රමයෙන් මෝදුවීගන එන විට සියල්ලෝ ම වැඩි වැඩියෙන් දොඩමළු වන්නට වූහ. එකිනෙකා බොහෝ සුහදව විහිළුතහළු කර ගනිමින් රා බීවෝ ය. ක්‍රමයෙන් සද්දය වැඩි ය. හයියෙන් හයියෙන් කතා ය. හිනා ය. "මේ වගේ රා පොඩිඩක් බිව්වෙ හෑ අවුරුදු ගාණකින්. මගෙ අම්මප. නැද්ද පොඩිඩයියෙ." එකෙකුගේ හඬ ය.

"යක්..කෝ අම්මප ඇත්ත මරු බඩු" අනෙකා කීවේ ය. ඔවුන් රාවල වරුණ පවසන විට සුද්දබාප්පාගේ මුනුණේ මල් පිපෙයි. ඒ අතර ම ඔහු තවත් රා විදුරුවක් වත්කර කෙනෙකුට දෙයි.

"දියාං මලේ ගහන්නංකො කළගෙඩියක් උණත්. " රා විදුරුව ගත් මිනිසා වැනෙමින් දොඩවයි. ඔහුගේ ඇස් රතු වෙලා ය.
දැන් එකා දෙන්නා ගේ කටින් කුණුහරුප ද කියැවෙයි. "අම්මප බුදු මල්ලියෙ උඹ මට මොනව කළත් මං තරහ නෑ. ඔව් මයෙ අම්මප. ඒ උනාට මං ගෙදර නැති වෙලාවට උඹ අපේ ගෙවල් පැත්තෙ කරක්ගහනව කියල ආරංචියි ඩෝ. හැබැයි මලේ මීට පස්සෙ ඔය නොසංඩාල වැඩේට යනව හෙම නෙවෙයි යකෝ. මං තොපි දෙන්නවම බාවනව. ඔව්. මයෙ අම්මප.''

අනෙකාගේ ඇස් උඩ ගියේ ය. "ක...ක්හ්විද ඔය මුසාවාදෙ ඇද බෑවෙ. බුදු අයියෙ මං එහෙම කැත වැඩ කරන මිනිහෙක් ද?. අයියෙ මගෙ හැටි දන්නවහෙ."

"වහපන් පාහර බල්ල කට. තොගෙ හැටි දන්න හින්දැ තමයි යකෝ. කට හොල්ලන්න එපා. තෝව මෙතනම බාවනව. කපල කපල ගඟට දානව." ඔහු දත්මිටි කන ශබ්දය බොහෝ ඈතට ඇහෙනවා ඇතැයි මට සිතේ.

බිත්තිය අයිනේ තිබූ උදැල්ලක් අතට ගත් කෙනෙක් "තොපි දෙන්නව ම බාවනව මෙතන." කියාගෙන පෙරට පැන්නේ ය. තව කෙනෙක් ඔහුගේ පිටු පසට පැමිණ ඇඟ වටා දෑත යවා අල්ලා ගත්තේය. මිනිසා උදැල්ල ගෙන දඟලන විට වෙන අයෙක් පැමිණ උදැල්ල උදුරා ගත්තේ ය. මුලින් ඇවිළුණු දෙදෙනා ම දැන් උදැල්ලෙන් ගහන්න හැදූ පුද්ගලයාට ගහන්න පැන්නෝ ය. තව දෙදෙනෙක් එය වැළැක් වූ හ.

මේ ගාලගෝට්ටිය ඇසී මිදුලට දුවගෙන ආ එම් පොඩිඅම්මා ගැහැණු කටහඬක් නැතිව තිබුණු අඩුව පිරිමැසී ය. " මේක මළපුලියක් නෙ. දැක්කායින් දැක්කෙ නැහැ මේ වගේ වලත්තයො ටිකක්. අනේනේ. මීට පස්සෙ හෙමනං මෙහෙ එන්නෙපා." අයය රා මුට්ටිය ඔසවා ගෙන ගෙය ඇතුළට දිව්වා ය.

මේ කලබගෑනිය අස්සේ සුද්දබාප්පා සල්ලි එකතු කර ගන්නට පොරේ ය. එකිනෙකා සල්ලි ඇද දෙන විට ඔහුගේ අත් දෙක වෙවුලයි.

හූ ශබ්දයක් ඇසුණේ එවිට ම ය. හූ ශබ්දය ඇසී මොහොතක් ගියේ නැත. කාකි ෂූට් දෙකක් කිඳෙල්පිටියෙ ආතා සහ ආබුආච්චි ජීවත් වූ නිවස අද්දර රටපම්බු ගහ ළඟින් මෑත් වී වේගයෙන් ගෙය දෙසට එනවා පෙනුණි.
පහුරේ පැමිණි පිරිස දුවගෙන ගොස් එකා දෙන්නා ගඟට පැන පහුරට පීනුවෝ ය.

සුද්දබාප්පාට කර කියා ගන්නට දෙයක් නැත. බොහෝ අසරණ වෙලා ය. දෙතොල් ගැහෙන්නට විය. කරේ මාරු වෙමින් තිබූ අඹුඩ ලේන්සුව අතට පැන්නේ ය. ඔහු බැගෑපත් ලිලාවෙන් හිස පාත්කර පැත්තකට වුණේ වරදක් කළ පොඩි එකෙකු මෙනි.

කාකි ෂූට් කාරයන් දෙන්නා කෙළින් ම පැමිණ ඉස්තෝප්පුවේ තිබූ වැල්ඇඳද උඩ වාඩි වූ හ.

"අනේ බුදු රාලාමි, මේ මනුස්සය දැන් මාස ගාණක් තිස්සේ වාත අමාරුව හැදිල ඔන්පොළේ. කරන්න දෙයක් නැතුව මේ ගහේ තෙලිජ්ජ ඩිංගක් වත්කරගෙන යන්නං පහේ ඩිංගක් ගෙනල්ල කනව. මයෙ අම්මප රාලාමි. මගෙ ඇස් දෙකප." එම් පොඩිඅම්මාගේ තොරතෝංචියක් නැති කන්නලව්වකි.

"කොහෙද බං කොන්දෙ අමාරුව නං තෙලිජ්ජ බාන්න ගස් නගින්නෙ. කෑ ගහන් නැතුව ගිටපන් යෝදියෙ. විධානය කලේ උඩු රුවුළ තිබුණු කාකි ෂූට් කාරයා ය.

"පීටිංඅයියෙ උඹට මාව අඳුනන්න බැරිද බං. මෙහෙ වරෙන්කො." අනෙක් කාකි ෂූට් කාරයා සුද්දබාප්පාට කතා කළේ කරුණාවෙනි. "යකෝ පීටිංඅයියෙ ඇයි බං පහළ කරන්නගොඩ ජැන්ඩි උන්නැහෙගෙ දුවනෙ බං මං බැඳල ඉන්නෙ. උඹට අඳුනන්න බැරිද? ඔන්නෙහෙ මොනව හරි තියෙනවනං ගනින් බං විදුරුවක් "

සුද්දබාප්පාගේ මුණේ ඇඳී ගියේ සිනා මල් පොහොට්ටුවකි. "බොලේ හැබෑට - ඉන්න්න්න" කියූ ඔහු ගේ තුළට දුවගෙන ගොස් රා කළය ගෙනැවිත් ඔවුන් ළඟින් තබා නැවත දුවගොස් ලොකු විදුරුවක් රැගෙන මිදුලට බැස ගඟට දුවගෙන ගියේ, විදුරුව සේදීමට ගඟේ වතුරද මදි තරමේ හක්තිවන්ත කමකිනි. එය සෝදාගෙන විත් විදුරුව පිරෙන්නට රා වත්කර දෝතින් ම එක අයෙකුට පිරිනැමුවේ දේව පූජාවක් තබන්නාක් මෙනි.
එම්පොඩිඅම්මා පිළෙවිතියක් මෙන් මසද්සොක්කා සහ මාළුහොදි බෙලෙක් පිගන් දෙකක රැගෙන විත් ඇතුළුපතක් බිමින් එළා ඒ මත තබන විට මුනුණේ තිබුණේ සැහැල්ලු මනරම් සුන්දර පෙනුමකි.

වහලේ එල්ලා තිබුණු ආනේ සිටි කළු කිටියා එක විටම පැන්නේ කාකිෂූට් අතක නැළවෙමින් සිටි හුංගෙකුට ය. ඕයපත් වූ රාලහාමි පෙරළුණේ රා මත ද තරමක් අරක් ගෙන සිටි නිසා විය හැකිය. විදුරුව පැත්තක වැලි කයි. හුංගා කළු කිටියාගේ කටට පැන නොපෙනී ගියේ ය.

"යක්කෝ මං බයවුණ තරමක්." පැවසූ ඔහු නැගිට නැවත උඩ බලා ඇඳ උඩ වාඩි වී තව රා විදුරුවක් වත් කරවා ගෙන බීගෙනබීගෙන ගියේ බළලා කෙරේ තිබුණු කේන්තියෙන් ඌට නොඳ පාඩමක් උගන්වන්නට මෙනි.
''උඹල පරිස්සමින් කරගනිල්ල. කෝ මට ගින්දර ඩිංගක් දියං. අපි ආයි හෙටනිද්ද දවසක එනවා. හොඳේ?"යි පැවසුවේ උඩු රුවුළ ඇති රාලහාමි ය.
එම්පොඩිඅම්මා ගෙනත් දුන් ගිතිපෙනෙල්ලෙන් සිගරැට් දෙකක් පත්තු කරගත් ඔවුන් දෙදෙනා තොප්පි දෙක ගසාදමා හිසට දමාගෙන අඩිපාර දිගේ යන්නට ගියේ ය. සුද්දබාප්පා සහ එම් පොඩිඅම්මා ඒ දෙස බලා සිටියේ බොහෝ කාලයක් තුළ වැඳ යැද යාඥා කර දේව වරමක් ලබාගත් හක්ති වන්තයින් දෙදෙනෙකු මෙන් සැහැල්ලු මනසකිනි.